**පොදු චක්‍රලේඛ අංක:**

**සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,**
**පළාත් / නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,**
**ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්,**
**පළාත් රෝහල් වෛද්‍ය අධිකාරීවරුන් සහ**
**ආයතන ප්‍රධානීන්.**

## ජාතික විෂ නිවාරණ සතිය - 2017 ඔක්තෝබර් 23 – 29 දක්වා

## "විසකුරු සත්ව දෂ්ටන වළකමු"

ජාතික විෂ නිවාරණ සතිය ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය මඟින් පසුගිය වසර කිහිපයක් මුළුල්ලේ අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබන ජාතික සෞඛ්‍ය වැඩපිළිවෙලක් වන අතර එමගින් විවිධ විෂ වීම් වැළැක්වීම හා ප්‍රතිකාරයන් පිළිබඳව මහජනතාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම පුද්ගලයින් දැනුවත් කරනු ලබයි.

ලෝකයේ සිදු වන සර්ප දෂ්ටන වාර්තා වීම් අතර ශ්‍රී ලංකාවද ඉහළ අගයක් ගනී. රජයේ රෝහල් සඳහා වාර්ෂිකව වාර්තා වන සර්ප දෂ්ටන සංඛ්‍යාව 33000 පමණ වේ.ප්‍රතිශතයක් ලෙස ගත් කළ ශ්‍රී ලංකාවේ සර්ප දෂ්ටන අතරින් 95% පමණ උග්‍ර විෂ සහිත නයා, තිත් පොළඟා, කරවලා යන සර්ප විශේෂ හේතුවෙන් සිදු වන අතර 27% ක් පමණ වූ සර්ප දෂ්ටන කුණකටුවන් නිසා වාර්තා වී ඇත.

2015 වසරේ වාර්ෂික වෛද්‍ය සංඛ්‍යාලේඛණ දත්ත වලට අනුව සර්ප දෂ්ටන හේතුවෙන් රෝහල්ගත වී ඇති සංඛ්‍යාව 36631 ක් වන අතර ඉන් පුද්ගලයින් 78 ක් මියගොස් ඇත. මෙම සිදු වීම් වාර්තා ගත වී ඇත්තේ කුරුණෑගල, අනුරාධපුර, ගාල්ල, කළුතර, නුවර, මාතලේ, හම්බන්තොට, පුත්තලම, පොළොන්නරුව, බදුල්ල, මොනරාගල, රත්නපුර, කෑගල්ල යන දිස්ත්‍රික්ක වලිනි.

මෙයට අමතරව ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානයේ සමීක්ෂණ වලට අනුව 2014 වසර තුල විෂ සහිත මුහුදු ජීවී දෂ්ටන 94 ක් පමණ වාර්තා වී ඇති අතර, මින් වැඩිම දෂ්ටන ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ යාපනය දිස්ත්‍රික්කයෙනි. තවද පුත්තලම,ගාල්ල හා කොළඹ දිස්ත්‍රික්කවලින්ද මෙම දෂ්ටන වාර්තා වී ඇත.

තවද 2014 වර්ෂයේ ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානයේ සමීක්ෂණවලට අනුව බඹර,දෙබර දෂ්ටන හේතුවෙන් පුද්ගලයන් 1231 ක් රෝහල් ගත කරනු ලැබූ අතර වැඩිම දෂ්ටන ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ නුවර එළිය දිස්ත්‍රික්කයෙනි. නුවර, පොළොන්නරුව, වව්නියාව හා අනුරාධපුරය යන දිස්ත්‍රික්ක වලින්ද සැළකිය යුතු දෂ්ටන සංඛ්‍යාවක් වාර්තා වී ඇත.

මේ හැරුණු විට අනෙකුත් විෂ සහිත සත්ව දෂ්ටන අතර ගෝනුස්සන්, පත්තෑයන් සහ වෙනත් කෘමි සත්ව දෂ්ටන ද වැදගත්වේ. යාපනය අර්ධද්වීපයේ රතු ගෝනුසු දෂ්ටන හේතුවෙන් මරණ කිහිපයක් වාර්තා වී ඇත.

දැනට පවතින ජාතික සංඛ්‍යා ලේඛන දත්ත වලට අනුව විසකුරු සත්ව දෂ්ටනවලින් වැඩි ප්‍රමාණයක් සිදුව ඇත්තේ සර්ප දෂ්ටන වලිනි.

මෙකී සන්දර්භය තුල විෂ සහිත සතුන් වෙතින් ඇතිවන රෝහල් ගත වීම් හා මරණ අවම කරලීම අරමුණු කරගත් ජාතික වැඩපිළිවෙලක් අතිශය වැදගත් වේ.

ඒ අනුව දිවයින තුල වාර්ෂිකව සිදුවන විෂ සහිත සත්ව දෂ්ටන අවම කර ගැනීම සඳහාත්, එමගින් සිදුවන රෝහල් ගත කිරීම් හා මරණ අඩු කිරීම සඳහාත්, සැලසුම් සහගත වැඩ පිළිවෙලක් ලෙස ජාතික විෂ නිවාරණ සතිය පහත දැක්වෙන පරිදි පැවැත්වීමට අනතුරු වැලැක්වීමේ ජාතික කමිටුව තීරණය කර තිබේ .

**නියමිත කාළ වකවානුව - 2017 ඔක්තෝබර් 23-29 දක්වා**

**තේමාව - "විසකුරු සත්ව දෂ්ටන වළකමු"**

**අරමුණු-**

1. විෂ සහිත සත්ව දෂ්ටන හේතුවෙන් රෝහල්ගතවන හා මියයන සංඛ්‍යාව අවම කර ගැනීම.
2. ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානයේ කාර්යභාරය ඵලදායී ලෙස ඒ සඳහා දායක කර ගැනීම පිළිබඳ සියළුම පාර්ශවයන් දැනුවත් කිරීම.
3. මෙම කටයුතු සඳහා සියළු අදාළ පාර්ශව සමග එක්ව ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් තීරණය කොට ක්‍රියාවට නැංවීම.
4. කාලීන වශයෙන් වැදගත් වන සත්ව දෂ්ටන අවම කර ගැනීම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම.

**යෝජිත කාර්යයන් -**

1. කාර්ය මණ්ඩල සාමාජිකයින් හා ප්‍රජාව දැනුවත් කිරීමට අධ්‍යාපනික වැඩසටහන් කේන්ද්‍ර කරගත් ක්‍රියාකාරි වැඩපිළිවෙලක් ආයතනය තුල හා ප්‍රජා මට්ටමින් සංවිධානය කිරීම. උදා. අධ්‍යාපනික දේශන, අධ්‍යාපනික ප්‍රදර්ශන, අත්පත්‍රිකා, පෝස්ටර් බෙදා හැරීම
2. වැඩසටහන සදහා සහභාගිත්වය හා අනුග්‍රාහකත්වය දක්වන විවිධ නියෝජිතයන් වෙතින් ජාතික මධ්‍යස්ථානය මගින් ඉටුකිරීමට යෝජනා වී ඇති හා වත්මන් කාර්යන් පිළිබදව අදහස් සහ යෝජනා ලබා ගැනීම.
3. මෙකී චක්‍රලේඛය මගින් දැක්වෙන පරිදි දීප ව්‍යාප්ත මට්ටමින් ප්‍රජාව විධිමත්ව දැනුවත් කිරීම පිණිස වැඩ සටහන් සඳහා උපදෙස් සැපයීම, ජනතාවට සිදුවන හානි අවම කරලීම.

5. **"ජාතික විෂ නිවාරණ සතිය"** ක්‍රියාත්මක වන සතිය තුළ සුදුසු පරිදි ආයතනය තුල ප්‍රචාරක පුවරුවක් හා බැනරයක් ප්‍රදර්ශනය කිරීම.

මේ සම්බන්ධයෙන් අවම වශයෙන් සුදුසු පරිදි එක් වැඩ සටහනක් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, දිසා වෛද්‍ය නිලධාරී, මහ රෝහල් සහ ශික්ෂණ රෝහල් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතුය. මෙම වැඩ සටහන සම්බන්ධීකරණය කරනු ලබන කොළඹ ශ්‍රී ලංකා ජාතික රෝහලේ ස්ථාපිත ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය වෙතින් උපදෙස් හා මාර්ගෝපදේශන ලබා ගත හැකි අතර වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක 011-2686143, 011-691111- දිගු අංක 2430 ඔස්සේ එම මධ්‍යස්ථානය හා සම්බන්ධ විය හැක.

ජාතික විෂ නිවාරණ සතිය වෙනුවෙන් ඔබ සේවා ස්ථානයේ සහ ප්‍රජාව තුල ක්‍රියාත්මක කරන ලද කටයුතු පිළිබඳව සවිස්තර වාර්තාවක් සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන් විසින් එම කාර්යයන් නිම කිරීමෙන් පසුව අධ්‍යක්ෂ / බෝනොවන රෝග වෙත ඉදිරිපත් කළ යුතුය.

මෙම චක්‍රලේඛය කාර්ය මණ්ඩලයේ සියළුදෙනාටම දැන ගැනීමට සලස්වන ලෙස ඉල්ලා සිටින අතර එහි ඇතුළත් කරුණු ක්‍රියාත්මක කිරීමට වගබලා ගන්නා මෙන් ඉල්ලා සිටිමි.

**ජනක සුගතදාස**
**ලේකම්**
**සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**